රුහුණ විශ්වවිද්‍යාලයය

# UNIVERSITY OF RUHUNA

**අභ්‍යන්තර චක්‍රලේඛ අංක. 2010/04**

**නේවාසික දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කිරීම**

1990.03.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/90 හා 2001.02.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 393 හි විධිවිධාන වලට අනුකූලව විශ්වවිද්‍යාලයේ පහත සදහන් නිලධාරීන්ට කාර්යාල සහ නිවාස දුරකථන සඳහා දක්වා ඇති මාසික උපරිම මූල්‍ය සීමාවන්ට යටත්ව පහසුකම් සපයනු ලැබේ.

| | තනතුර | මූල්‍ය සීමාව | |
|---|---|---|---|
| | | කාර්යාලයීය* (රු.) | නේවාසික (රු.) |
| (i) | උපකුලපති/නියෝජ්‍ය උපකුලපති | 5000.00 | 4000.00 |
| (ii) | පීඨාධිපති/ලේඛකාධිකාරී/මූල්‍යාධිකාරී/පුස්තකාලයාධිකාරී | 3500.00 | 2500.00 |
| (iii) | අධ්‍යයනාංශ ප්‍රධානීන්<br>ප්‍රධාන විනය පාලන/ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක | 1500.00 | 1500.00 |
| (iv) | අංශ ප්‍රධානීන් (ශිෂ්‍ය කටයුතු/සාමාන්‍ය පාලන/සැපයීම්/නීති හා ලේඛණ/ප්‍රධාන ආරක්ෂක නිලධාරී/වැඩ ඉංජිනේරු) | 1500.00 | 1500.00 |
| (v) | පාලක සභාවේ විශේෂ අවසරයට යටත්ව හිමිකම් ලබන විශේෂ කාර්ය මණ්ඩලය (අධ්‍යයන/පරිපාලන හා මූල්‍ය/ප්‍රධාන වෛද්‍ය නිලධාරී) | 1500.00 | 1000.00 |

* ඇමතුම් ගාස්තුව පමණි.

(අ) ඉහත (i) හා (ii) නිලධාරී කාණ්ඩ සඳහා අදාළ සීමාවන් බදු මුදල් සහ මාසික කුලියෙන් නිදහස් වන අතර අදාළ මූල්‍ය සීමාව ඒ අනුව ගණන් බැලෙනුයේ මාසික ඇමතුම් ගාස්තු පමණි. තවද එකී නිලධාරීන්ගේ නේවාසික දුරකථන ගෙවීම් සලකා බැලීමේදී ස්ථාවර දුරකථනය හෝ ජංගම දුරකථනය යන දෙකෙන් එක් දුරකථනයක් සඳහා ගෙවීම් කළ හැකිය.

(ආ) උපකුලපති හා නියෝජ්‍ය උපකුලපති තනතුරු සඳහා ඉහත කාර්යාලයීය හා නේවාසික දුරකථන වලට අතිරේකව ජංගම දුරකථන සඳහා ගෙවීම් කරනු ලැබේ. ඒ අනුව එකී දුරකථනයෙහි මාසික බිල්පතෙහි මුළු වටිනාකම රු. 2000/- දක්වා ගෙවීම් ප්‍රතිපූරණය කරනු ලැබේ.

(ඇ) ඉහත (i) හා (ii) කාණ්ඩ සඳහා දුරකථන බිල්පත් විශ්වවිද්‍යාලය මඟින් නිරවුල් කිරීම හෝ ප්‍රතිපූරණය කරන අතර දුරකථන බිල්පත් වලින් 10% ක් හෝ රු. 100/- යන දෙකෙන් අවමය අදාළ නිලධාරියාගේ මාසික වැටුපෙන් අය කරනු ලැබේ.

(ඈ) ඉහත අනෙකුත් කාණ්ඩ යටතේ සැලකෙන නිලධාරීන් විසින් සිය මාසික බිල්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලය විසින් (හිමිකම් ලබන සීමාව අනුව) ප්‍රතිපූරණය කරනු ලැබේ

(ඉ) ඉහත (iii), (iv) සහ (v) කාණ්ඩ වලට අයත් කිසියම් නිලධාරියෙකු විසින් සිය දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කරන ලෙස ප්‍රථම අවස්ථාවේදී ඉල්ලුම් කරනු ලබන විට සිය නිත්‍ය රාජකාරි කාලයෙන් පසුව තමාගේ නේවාසික දුරකථනය රාජකාරි කටයුතු සඳහා භාවිතා කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳව පාලක සභාව සෑහීමකට පත් වන ආකාරයේ තොරතුරු අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබිය යුතුය.

(ඊ) මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වීමත් සමගම මේ සම්බන්ධයෙන් මීට ඉහත නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍රලේඛ අංක 26/2000 අවලංගු වේ.

(උ) මෙම අභ්‍යන්තර චක්‍රලේඛ විධිවිධාන 2010.09.15 දින සිට ක්‍රියාත්මක වේ.

14/02/2011

මහාචාර්ය ගාමිණී සේනානායක
වැ.බ. උපකුලපති
2011.02.14